වාරියපොල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 23 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වාරියපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 132,655,410 ක් විය.ඉන් ආසන්න වශයෙන් සියයට 5.5 ක් ලෙස රු.7,308,279 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.73,089,439 ක් විය. ඉන් ආසන්න වශයෙන් සියයට 4 ක් ලෙස රු. 3,242,281 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

02 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.34,185,282ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,381,390 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.25,803,892ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.148,422,759 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.156,851,769ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.25,756,272 ක අතිරික්තයක් බවට පත්ව ඇත.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.173,460,707 න් ආසන්න වශයෙන් සියයට 72.29 ක් ලෙස රු.125,404,528 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.148,422,759 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.139,275,425 න් ආසන්න වශයෙන් සියයට 37.61 ක් ලෙස රු.52,380,418 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් ආසන්න වශයෙන් සියයට 88.04 ක් ලෙස රු.46,114,932 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වියදම වූ රු.156,851,769 න් ආසන්න වශයෙන් සියයට 5.4 ක් ලෙස රු.8,429,009 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබූ අතර ආසන්න වශයෙන් ඉතිරි සියයට 94.6 ක් වූ රු.148,422,759 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් සිදු කල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.502,625 ක්ද මුද්දර ගාස්තු රු.58,919,836 ක්ද විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ ගණනක සිට අය වීම හිඟ හිට ඇති සේවක ණය ශේෂය රු.31,992 ක් විය.

3.2 <u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

සභාව සතු වාහන 05 ක් වසර 2 සිට වසර 4 දක්වා කාලයක් ධාවනයෙන් ඉවත් කර පැවති අතර අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට පියවර ගෙන නොතිබුණි.

3.3 <u>ව්‍යාපෘති ප්‍රමාද කිරීම</u>

සභාවේ එක් ගමකට එක් වැඩක් වැඩ සටහන යටතේ 2014 ක්‍රියාත්මක කිරීම සඳහා රු.44,730,655 ක් වටිනා කර්මාන්ත 84 ක් 2014 දෙසැම්බර් 31 වන විටද අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) කොන්ත්‍රාත් පාලනය